# දෙවන වාර පරීක්ෂණය - 2018

## නර්තනය

**07 ශ්‍රේණිය**

නම :

කාලය පැය 02 යි.

### I කොටස

- නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. 'මුණි සිරිපා සිඹිමින්නේ - සමනොල ගිරි පෙදෙසින්නේ......'
මෙම කවිය අයත් වන්නේ,

(1) නැලවිලි කවි වලටය (2) වන්නම් වලට ය
(3) කුළු කවි වලට ය (4) ලී කෙළි කවි වලට ය

02. උඩරට සහ පහතරට නර්තන සම්ප්‍රදායන්හි පා සරඹ ගණනින්,

(1) 10 කි (2) 15 කි
(3) 12 කි (4) 18 කි

03. ප්‍රායෝගික නර්තනයේ දී කාලය වේග තුනකින් දැක්විය හැකිය. ඒවා නම්,

(1) උඩරට , පහතරට , සබරගමු ය (2) සුළු , මැදුම් , මහ ය.
(3) විලම්භ , මධ්‍ය , දෘත ය. (4) මාත්‍රා , තිත , ලය ය

04. වඳුරෙකුගේ චර්යා රටාවන් විස්තර කරමින් නිර්මාණය වී ඇති වන්නමකි.

(1) ගජගා වන්නම (2) සමනල වන්නම
(3) අනිලා වන්නම (4) හනුමා වන්නම

05. සුළු මැදුම් දෙතිතට අයත්,

(1) මාත්‍රා 3 + 3 (2) මාත්‍රා 2 + 3
(3) මාත්‍රා 4 + 4 (4) මාත්‍රා 3 + 3

- පහත ප්‍රශ්ණ අංක 06 සිට 10 දක්වා ප්‍රශ්ණ සඳහා පිළිතුර හරි නම් ( ✓ ) ලකුණ ද , වැරදි නම් ( ✗ ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. නම්‍යතා අභ්‍යාසයේ යෙදීමෙන් නර්තනයට අවශ්‍ය ශාරීරික සමබරතාවය වර්ධනය කරගත හැකිය. (..................)

07. සෑම දේශීය වන්නමක්ම කොටස් 6 කින් යුක්තය. (..................)

08. ගැමි නැටුම් සඳහා උපකරණ භාවිතා නොකරයි. (..................)

09. තල මල පිපීම ගමට සුභපල දෙන සිදුවීමක් ලෙස ගැමියා විශ්වාස කරයි. (..................)

10. තිත්තවෙල ගුණයා මහතා දක්ෂ උඩරට නැටුම් ශිල්පියෙකි. (..................)

- 11 - 15 ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර වරහන් තුළින් තෝරා හිස් තැනට ලියන්න.
  (ගොප් ගෙඩිය / තාලම්පට / දවුල / කුළු නැටුම / ගැමි නැටුම් / තෛපොංගල්)

11. තාල වාදනය සඳහා යොදා ගන්නා වාද්‍ය භාණ්ඩය ............................................................................... වේ.

12. ගැමියාගේ ජීවන අවශ්‍යතා පසුබිම් කරගෙන ............................................................................... නිර්මාණය වී ඇත.

13. හින්දු භක්තික ද්‍රවිඩ ජනතාව විසින් ............................................................................... උත්සවය සමරනු ලබයි.

14. කෘෂිකර්මාන්තය හා බැඳුනු ගැමි නැටුමක් ලෙස ............................................................................... දැක්විය හැකිය.

15. ගොප්කොල යොදා නිර්මාණය කල හැකි සාම්ප්‍රදායික සැරසිල්ලකි ...............................................................................

- **A** කොටසට ගැලපෙන යෙදුම වරහන් තුළින් තෝරා **B** කොටස සම්පූර්ණ කරන්න.
  (විකල්ප වාද්‍ය උපකරණ / රංග වස්ත්‍රාභරණ /පෙරහැර / පා සරඹ / ගැමි නැටුම්)

| | A | B |
|---|---|---|
| 16. | මහ බඹා කෝලම | ............................................................ |
| 17. | කෝලාට්ටම් | ............................................................ |
| 18. | දණ්ඩි කඳ | ............................................................ |
| 19. | ගොප්කොළ තලාව | ............................................................ |
| 20. | වෙස් ඇඳුම් කට්ටලය | ............................................................ |

(ල. 1 × 20=20)

## II කොටස

**පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන ශාන්තිකර්මය නම් කරන්න.
    (ii) රත්නවල්ලි කවි යොදාගනිමින් නටනු ලබන ගැමි නැටුම් විශේෂය කුමක් ද?
    (iii) සබරගමු සම්ප්‍රදායේ ආධුනිකයෙකු, ශිල්පියෙකු ලෙස කලඑළි බැසීම හඳුන්වන්නේ කවර නමකින් ද?
    (iv) පහතරට නර්තන සම්ප්‍රදාය පවතින ප්‍රදේශ දෙකක් නම් කරන්න.
    (v) හේවිසි වාදන සඳහා යොදා ගන්නා ප්‍රධාන වාද්‍ය භාණ්ඩ දෙකක් නම් කරන්න.

(ල. 2 × 5 = 10)

02. (i) තනි තිතේ ප්‍රභේද ලියා දක්වන්න.
    (ii) 'දොං පිංත ගත දෙහුංත' යන බෙර පදය දී ඇති වගුව තුළ ප්‍රස්තාර කරන්න.

| | | | 1 2 3 |
|---|---|---|---|
| | | | |

    (iii) දී ඇති කවිය යොදා පහත වගුව සම්පූර්ණ කරන්න.

| | | 1 2 3 | 1 2 3 |
|---|---|---|---|
| | | | |

'අගේ වඩන මගෙතාලම් සරඹ බලන්නේ
වගේ නොදැන ඇයි නුඹලා කීමට එන්නේ....'

(ල. 3 + 3 + 4 = 10)

03. විවිධ ජන වර්ග හා බැඳි සංස්කෘතික උත්සව අතර රාමසාන් උත්සවය විශේෂ තැනක් ගනියි.
    (i) රාමසාන් උත්සවය පවත්වනු ලබන්නේ කවර ආගමිකයන් පිරිසක් විසින් ද?
    (ii) රාමසාන් උත්සවයේ මුස්ලිම් බැතිමතුන් විසින් ආරක්ෂා විශේෂ උපවාස සීලය හඳුන්වන නම කුමක් ද?
    (iii) රාමසාන් උත්සවය පැවැත්වීමට හේතු දෙකක් දක්වන්න.
    (iv) උපවාස ශීලය ආරක්ෂා කරන කාලයේ අනුගමනය කරන චාරිත්‍ර 2 ක් සඳහන් කරන්න.

(ල. 1 + 1 + 4 + 4 )

04. දවුල නිර්මාණය කිරීම පිළිබඳව දී ඇති තේමා යටතේ කරුණු දෙක බැගින් දක්වන්න.

    (i)

| සැදීමේ දී යොදා ගන්නා දැව වර්ග 2 ක් | සැදීමේ දී යොදා ගන්නා සම් වර්ග 2 ක් | දවුල යොදා ගන්නා වාදන අවස්ථා 2 ක් |
|---|---|---|
| | | |

    (ii) දවුලේ රූප සටහනක් ඇඳ දක්වන්න.
    එහි කොටස් දෙකක් නම් කරන්න.

(ල. 6 + 4 =10)

05. (i) උඩරට , පහතරට හා සබරගමු නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන ශාන්තිකර්ම 03 නම් කරන්න.